පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- (52) නර්තනය I

පාසලේ නම : ....................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02 යි

- **ප්‍රශ්න සියල්ලට** ම පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

## I කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී, නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට අදළා අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.**

01. උඩරට නර්තන සම්ප්‍රදායේ පා සරඹ 08, 10, 11 යන සරඹ වල සරඹ නාමයන් වන්නේ,
(1). නූහුරු අඩිය, දෙපැති අඩිය, චක්‍ර අඩිය වේ.
(2). කරනම් අඩිය, දෙපැති අඩිය, චක්‍ර අඩිය වේ.
(3). කරනම් අඩිය, තුන්පැති අඩිය, දෙපැති අඩිය වේ.
(4). නූහුරු අඩිය, කරනම් අඩිය, දෙපැති අඩිය වේ.
(5). කරනම් අඩිය, තුන්පැති අඩිය, චක්‍ර අඩිය වේ. (.....................)

02. උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් තුනේදී හස්ත චලන හුරුකිරීම සඳහා භාවිත සරඹ අභ්‍යාස හඳුන්වන්නේ, පිළිවෙලින්
(1). දොඹින පද, ඉලංගම් සරඹ, ගොඩ සරඹ යනුවෙනි.
(2). අත් සරඹ, මණ්ඩි සරඹ, ඉලංගම් සරඹ යනුවෙනි.
(3). ගොඩ සරඹ, ඉලංගම් සරඹ, මාත්‍රා පද යනුවෙනි.
(4). ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද යනුවෙනි.
(5). ගොඩ සරඹ, ඉලංගම් සරඹ, මණ්ඩි සරඹ යනුවෙනි. (.....................)

03. මංගලම් නර්තනය ඉදිරිපත් කරනු ලබන තිත් රූපය දැක්වෙන වරණය තෝරන්න.
(1). 1 2 / 1 2 / 1 2 / 1 2 3 / 1 2 3 4
(2). 1 2 / 1 2 / 1 2 3 / 1 2 3 / 1 2 3 4
(3). 1 2 / 1 2 / 1 2 / 1 2 3 / 1 2 3 4
(4). 1 2 / 1 2 / 1 2 / 1 2 3 4 / 1 2 3 4
(5). 1 2 / 1 2 / 1 2 / 1 2 3 / 1 2 3 (.....................)

04. මාත්‍රා 3 + 3, මාත්‍රා 3+4, මාත්‍රා 2+2+3, යන තාල රූපයන්ට නර්තනය කරනු ලබන වන්නම් පිළිවෙලින්,
(1). වෛරොඩි වන්නම, සුරපති වන්නම, සැවුලා වන්නම වේ.
(2). ගණපති වන්නම, මයුරා වන්නම, සුරපති වන්නම වේ.
(3). ගණපති වන්නම, මුසලඩි වන්නම,මයුරා වන්නම වේ.
(4). වෛරොඩි වන්නම, සැවුලා වන්නම, මයුරා වන්නම වේ.
(5). ගණපති වන්නම, සැවුලා වන්නම, මයුරා වන්නම වේ. (.....................)

05. 'තක්කඩ තරිකිට පිත් තත් -තෙහිං තෙහිං පිත් තත් ...' සහ'පිං කුඳ ගජිත කුඳං ගජිංත ගජිත කුඳං' යන අඩව් දෙක නර්තනය කරනු ලබන්නේ,

(1). අස්නේ නර්තනයේ හා කුඳංත ගත දොම් වට්ටමේ දී ය.

(2). කුඳංත ගත දොම් හා දෙං ජිංත ගත දොම් වට්ටමේ දී ය.

(3). දෙං ජිංත ගත දොම් හා කුඳංත ගත දොම් වට්ටමේ දී ය.

(4). අස්නේ නර්තනයේ හා දෙං ජිංත ගත දොම් වට්ටමේ දී ය.

(5). අස්නේ නර්තනයේ හා මංගලම් නර්තයේ දී ය. (....................)

06. දේශීය තාල පද්ධතියේ දී මාත්‍රා තුනේ ගති ලක්ෂණයට සමාන වන කර්ණාටක තාල පද්ධතිය වන්නේ,

(1). ඛණ්ඩ චාපු වේ. (2). සංකීර්ණ ජාති වේ.

(3). ඛණ්ඩ ජාති වේ. (4). තිශ්‍ර චාපු වේ.

(5). මිශ්‍ර චාපු වේ. (....................)

07. බලි ඇදුරාගේ රංග වස්ත්‍රාභරණ වලට අයත් කොටස් වන්නේ,

(1). උරමාලය, නවගුණවැල හා පච්චවඩම ය.

(2). උරමාලය, නවගුණවැල හා ඉනහැඩය ය.

(3). ජටාව, අවුල්හැරය හා බන්දි වළලු ය.

(4). සේලය, ජටාව හා අවුල්හැරය ය.

(5). ජටාව, උරබාහු, හා අවුල්හැරය ය. (....................)

08. කතකලි නර්තනය සඳහා බල පෑ ජන නාටක වන්නේ,

(1). රාමනාට්ටම්, කුඩි ආට්ටම් සහ අට්ඨ කතා ය.

(2). රාමනාට්ටම්, කුඩි ආට්ටම් සහ චක්කියාර්කුත්තු ය.

(3). චක්කියාර්කුත්තු, කුඩි ආට්ටම් සහ අට්ඨ කතා ය.

(4). චක්කියාර්කුත්තු, රාමනාට්ටම් සහ කතා නාටක ය.

(5). කුඩි ආට්ටම්, ක්‍රිෂ්ණාට්ටම් සහ අට්ඨ කතා ය. (....................)

09. මනිපුරි නර්තනයේ රාධාගේ චරිතය සඳහා යොදා ගන්නා රංග වස්ත්‍රාභරණ වන්නේ,

(1). රිෂම්පුරිට්, ධෝතිය සහ කිරීටම් ය.

(2). රිෂම්පුරිට්, ධෝතිය සහ පොෂ්වාන් ය.

(3). රිෂම්පුරිට්, කුමින් සහ චූරා ය.

(4). රිෂම්පුරිට්, කුමින් සහ පොෂ්වාන් ය.

(5) රිෂම්පුරිට්, චූරා සහ පොෂ්වාන් ය. (....................)

10. භරත නාට්‍ය වල නෘත්ත ගනයට වැටෙන ශාස්ත්‍රීය නර්තන අංග දෙක පිළිවෙලින්,

(1). ජතිස්වරම් හා වර්ණම් ය. (2). ජතිස්වරම් හා ශබ්දම් ය.

(3). ජතිස්වරම් හා පදම් ය. (4). අලාරිප්පු හා පදම් ය.

(5). අලාරිප්පු හා තිල්ලානා ය. (....................)

11. කථක් නර්තනය සඳහා භාවිත වාද්‍ය භාණ්ඩ වන්නේ,
(1). පඛාවාජ්, මද්දල හා හාර්මෝනියම් වේ.
(2). වෙන්ඩාව, පඛාවාජ් සහ වීණාව වේ.
(3). වෙන්ඩාව, තබ්ලාව සහ වයලීනය වේ.
(4). පඛාවාජ්, තබ්ලාව හා හාර්මෝනියම් වේ.
(5) වෙන්ඩාව, මෘදංගම් හා කෝල් බෙරය වේ. (.....................)

12. අනුරාධපුර කුට්ටම් පොකුණ අසලින් ලැබුණු ලෝකඩ රූපයෙන් පිලිඹිබු වන්නේ,
(1). නිළියන් හා නළුවන්ගේ රූප පෙළකි.
(2). බෙර වාදකයෙකුගේ රූපයකි.
(3). භ්‍රමණය වන නලඟනකගේ නර්තන විලාසයකි.
(4). වීණා වාදකයින් සහ තාලම්පට වයන රූපයකි.
(5). නටන ස්ත්‍රියක සහ පුරුෂයෙකුගේ විලාශයකි. (.....................)

13. වෙනිවර, ගැටිය හා සවරම යොදා ගනු ලබන්නේ පිළිවෙලින්,
(1). පහතරට බෙරය, දවුල, තම්මැට්ටම
(2). උඩරට බෙරය, පහතරට බෙරය, උඩැක්කිය
(3). ගැටබෙරය, දවුල, උඩැක්කිය
(4). ගැටබෙරය, දෙවොල් බෙරය, උඩැක්කිය
(5). දෙවොල් බෙරය, ගැටබෙරය, උඩැක්කිය (.....................)

14. 'අක්කා ඉතින් නාඬන්නේ - එක්ව ගොසින් අපි එන්නේ' මෙහි,
(1). ලඝු මත් 06 ක්, ගුරු මත් 10 ක් හා සැඳැස්මත් 24 ක් වේ.
(2). ලඝු මත් 05 ක්, ගුරු මත් 10 ක් හා සැඳැස්මත් 25 ක් වේ.
(3). ලඝු මත් 08 ක්, ගුරු මත් 08 ක් හා සැඳැස්මත් 20 ක් වේ.
(4). ලඝු මත් 07 ක්, ගුරු මත් 08 ක් හා සැඳැස්මත් 20 ක් වේ.
(5). ලඝු මත් 05 ක්, ගුරු මත් 20 ක් හා සැඳැස්මත් 25 ක් වේ. (.....................)

15. 'රටයකුම හෙවත් රිද්දියාගය' සහ 'කොහොඹායක් කංකාරිය සහ සමාජය' යන කෘති රචනා කරන ලද්දේ පිළිවෙලින්,
(1). මුදියන්සේ දිසානායක සහ ලයනල් බෙන්තරගේ ය.
(2). ආරියරත්න කළුආරච්චි සහ එදිරිවීර සරච්චන්ද්‍ර ය.
(3). එදිරිවීර සරච්චන්ද්‍ර සහ මුදියන්සේ දිසානායක ය.
(4). ලයනල් බෙන්තරගේ සහ තිස්ස කාරියවසම් ය.
(5). තිස්ස කාරියවසම් සහ මුදියන්සේ දිසානායක ය. (.....................)

16. උඩරට, පහතරට, සබරගමු ශාන්තිකර්ම වලට අයත් නාට්‍යමය පෙළපාලි අවස්ථාවන් පිළිවෙලින්,
(1). ඌරා යක්කම, නානුමුරය, පොත්කඩේ යක්කම ය.
(2). ඌරා යක්කම, අසුර යක්කම, පොත්කඩේ යක්කම ය.
(3). නයා යක්කම, දොළහපෙළපාලිය, වැදි යක්කම ය.
(4). ගුරුගේ මාලාව, නානුමුරය, රටයකුම ය.
(5). ඌරා යක්කම, පොත්කඩේ, දොළහපෙළපාලිය ය. (....................)

17. රිද්දියාගය ශාන්තිකර්මයේ දී දක්නට ලැබෙන නර්තන අංග වන්නේ,
(1). මාරා පද නැටීම, ගිනි සිසිල, මල්පද නැටීම වේ.
(2). කුමාර සමයම නැටීම, ගිනි සිසිල, චාමරපද නැටීම වේ.
(3). කුමාර සමයම නැටීම, සමයං පද නැටීම, ආඬිගුරු නැටීම වේ.
(4). ගිනි සිසිල, ආඬිගුරු නැටීම, සමයං පද නැටීම වේ.
(5). චාමරපද නැටීම, ගිනි සිසිල, ආඬිගුරු නැටීම වේ. (....................)

18. 'දුන් සුමන විවරණ - කන්ද සුරිඳුගේ බලයෙන' යන කවි පදය අයත් වන්නේ,
(1). සන්නියකුමෙහි ලිච්ඡවි නැටුමට ය.
(2). රටයකුමෙහි නානුමුරයට ය.
(3). සන්නියකුමෙහි රීරී යකාට ය.
(4). සන්නියකුමෙහි කළු යකාට ය.
(5). රටයකුමෙහි කපුයක්කාරියට ය. (....................)

19. මන්තිරි වන්නම, මහබෝ වන්නම, නලඟන වන්නම යන නවතම වන්නම් රචනය කර ඇත්තේ පිළිවෙලින්,
(1). මුදියන්සේ දිසානායක, ඇස් පණීභාරත සහ ආරියරත්න කළුආරච්චි ය.
(2). ආරියරත්න කළුආරච්චි, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ මුදියන්සේ දිසානායක ය.
(3). මුදියන්සේ දිසානායක, ඩබ්.ඩී අමරදේව සහ ආරියරත්න කළුආරච්චි ය.
(4). මුදියන්සේ දිසානායක, ඩබ්.ඩී අමරදේව සහ ජයසේන කෝට්ටේගොඩ ය.
(5). ආරියරත්න කළුආරච්චි, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ ප්‍රේමකුමාර එපිටවෙල ය. (....................)

20. සාම්ප්‍රදායික බලි රූපයක් වර්ණ ගැන්වීම සඳහා යොදා ගනු ලබන්නේ,
(1). ගස්වල පොතු, කිරිමැටි සහ තේ කොළ ය.
(2). ගස්වල පොතු, බුලත් විට සහ දැලි ය.
(3). ශාක පත්‍ර යුෂ, ගාඩොල් කුඩු සහ පැන්කේක් ය.
(4). ශාක පත්‍ර යුෂ, දැලි, සහ පවුඩර් ය.
(5). ශාකපත්‍ර යුෂ, දැලි සහ අඹරාගත් යුෂ ය. (....................)

21. වලියක් මංගල්‍යයේ භාවිතා කරන වෙස් මුහුණ හඳුන්වනු ලබන්නේ,
(1). දළ කඩවර මුහුණ ලෙස ය. (2). ගරා කඩවර මුහුණ ලෙස ය.
(3). රීරී කඩවර මුහුණ ලෙස ය. (4). කළු කඩවර මුහුණ ලෙස ය.
(5). සුදු කඩවර මුහුණ ලෙස ය. (....................)

22. 'ඔහොම තනියම ගිහිල්ලා විදින්න බැහැ. දඩ මීමෙකුට මුවා වෙලා විදින්න ඕන' මෙම දෙබස ඇතුලත් නාට්‍යම අවස්ථාව දැක්වෙන්නේ,
(1). පහන් මඩුවේ පොත්කඩේ යක්කමේ දී ය.
(2). පහන් මඩුවේ අඹ විදමනේ දී ය.
(3). කොහොඹා කංකාරියේ ඌරා යක්කමේ දී ය.
(4). සන්නියකුමේ වැදි සන්නියේ දී ය.
(5). කොහොඹා කංකාරියේ ගබඩා කොල්ලයේ දී ය. (....................)

23. අංග රචනය හා බැඳි මූලිකාංග වන්නේ,
(1). වර්ණ, රේඛා, තල හා රංග වස්ත්‍රාභරණ ය.
(2). දිසා, තල, රේඛා හා හැඩතල ය.
(3). අවකාශය, රේඛා, හැඩතල හා වේශභූෂණ ය.
(4). වර්ණ රේඛා, හැඩතල හා අමුද්‍රව්‍ය ය.
(5). වර්ණ රේඛා, හැඩතල හා ආලෝකකරණය ය. (....................)

24. රස භාව පිළිබඳ අදහස් දැක්වූ පෙරදිග මතවාදීන් වන්නේ,
(1). භරතමුණි සහ ඇරිස්ටෝටල් ය.
(2). භරතමුණි සහ උද්ගම ධනංජය ය.
(3). නන්දිකේශ්වර සහ ප්ලේටෝ ය.
(4). අභිනවගුප්ත සහ ඇරිස්ටෝටල් ය.
(5). අභිනව ගුප්ත සහ ප්ලේටෝ ය. (....................)

25. 'මංගර සැහැල්ල, කිරි ඉතිරවීමේ කවි' යන ගායන අංග දක්නට ලැබෙන්නේ
(1). රටයකුම ශාන්තිකර්මයේ ය.
(2). වලියක් මංගල්‍යයේ ය.
(3). කිරි මඩුව ශාන්තිකර්මයේ ය.
(4). කඩවර කංකාරියේ ය.
(5). බලි ශාන්තිකර්මයේ ය. (....................)

- **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්න වලට අදාළ පිළිතුර යොදා හිස්තැරන් පුරවන්න.**

26. පතහවිස්ස, මාලක්කම, බඹර වළල්ල යනු ........................................................ නර්තන සම්ප්‍රදායේ භාවිත පැනීම්, කැරකීම් විධි කිහිපය කි.
27. බැරිසිල් මුද්‍රා නාට්‍යයෙහි රංග වින්‍යාස සැලසුම් කර ඇත්තේ .................................................. විසිනි.
28. 'වලයම' භාවිතයට ගැනේනේ ........................................................ ය.
29. 'මල් මඩුව' නම් වීදි සැරසිල්ල සකස් කරනු ලබන්නේ ........................................................ ශාන්තිකර්මයේ දී ය.
30. ආධුනිකයකු තම්මැට්ටම් වාදනය පුහුණු වීම සඳහා යොදා ගනු ලබන්නේ ........................................... ය.

31. පන්තේරුව රංග භාණ්ඩය ලෙස යොදා ගෙන බුදු ගුණ වයමින් සිදුකරනු ලබන නෘත්‍ය පූජෝපහාරය ............................................................ නමින් හඳුන්වනු ලැබේ.

32. යම, වායු, කාල සහ මුර්තු යනු බලි ශාන්තිකර්මයේ එන ............................................................ ට අයත් ගායනා විශේෂයකි.

33. සාම්ප්‍රදායික කථකලි වේදිකාව අලෝකරණය සඳහා භාවිතා කරන ලද්දේ ............................................. නම් වූ පොල්තෙල් පහන වේ.

34. 'දෙසිද සහ කොකුම් පිනිදිය සඳුන් ගෙනා...' මෙම කවිය නානුමුර පෙළපාලියේ ................................ අවස්ථාවේ දී ගයනා කරනු ලැබේ.

35. 'කුඳ ගත කුඳ ගත කුකු තක ජිංතට ගජ්ජිං කුංදත්' මෙම අලංකාර බෙර පදය මාත්‍රා ............................ තාල රූපයට වාදනය කළ හැක.

- **අංක 36 සිට 50 තෙක් ප්‍රශ්න වලට අදාළ පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

36. 'බුද්ධං සරණේ සිරස දරාගෙන' මෙම කවි පදය මාත්‍රා 3 තාල රූපය අනුව ගැයීමේ දී ඊට අයත් සැඳැස්මත් හා ගීමත් ගණන සඳහන් කරන්න.

(i). සැඳැස්මත් - ...............................................   (ii). ගීමත් - ...............................................

37. 'රිරි යකා' සහ 'කපුයක්කාරිය' යන නාට්‍යමය පෙළපාලි අයත්වන ශාන්තිකර්ම දෙක නම් කරන්න.

(i). .......................................................................   (ii). .......................................................................

38. කිරිමඩුව ශාන්තිකර්මයේදී පුද ලබන ප්‍රධාන දෙවියා සහ එය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ සඳහන් කරන්න.

(i). ප්‍රධාන දෙවියා - .......................................................................

(ii). ප්‍රධාන අරමුණ - .......................................................................

39. 'තිසරා වන්නම, ලලිතරාග තාලය' යන නාමයන්ගෙන් හඳුන්වන වන්නම් අයත් වන්නේ කුමන නර්තන සම්ප්‍රදායන්ට ද?

(i). තිසරා වන්නම - ...........................................   (ii). ලලිතරාග තාලය - ...........................................

40. අවනද්ධ භාණ්ඩ වාදනයේ දී මූලික අක්ෂර හා අනු අක්ෂර හඳුන්වන පාරිභාෂිත වචන පිළිවෙලින් දක්වන්න.

(i). .......................................................   (ii). .......................................................

41. නෙළුම් කවි හා ප්‍රශස්ති අයත් වන ගායනා වර්ග වෙන් කොට දක්වන්න.

(i) නෙළුම් කවි - ...........................................   (ii). ප්‍රශස්ති - ...........................................

42. 'ලයහරෝබා' හා 'තෝඩායම්' නර්තනාංග අයත් සම්ප්‍රදායන් නම් කරන්න.

(i) ලයහරෝබා - .............................................   (ii). 'තෝඩායම්' - ...........................................

43. 'උනුනුපියන' හා 'සොළොස්මගල' යන සැරසිලි භාවිතයට ගන්නා ශාන්තිකර්ම දෙක පිළිවෙලින් ලියා දක්වන්න.

(i) ...........................................................   (ii). ...........................................................

44. කුලු හා ගොයම් යන සිංහල ගැමි නැටුම් ද්‍රවිඩ ගැමි ගැටුම් වලදී හඳුන්වනුයේ පිළිවෙලින්

(i) ...........................................................   (ii). ...........................................................

45. 'බැරිසිල්' මුද්‍රානාට්‍ය ප්‍රථමවරට වේදිකා ගත කළ වර්ෂය හා ස්ථානය ලියන්න.

(i) වර්ෂය - ...........................................   (ii). ස්ථානය - ...........................................

46. වෙස්මෝස්තර රචනය ප්‍රධාන වශයෙන් බෙදිය හැකි කොටස් දෙක වන්නේ,

(i) ...........................................................   (ii). ...........................................................

47. තාලම්පටින් නිකුත් වන 'තිත් හා තෙයි' යන ධ්වනි දෙක සඳහා ප්‍රස්ථාරකරණයේ දී හැඳින්වෙන තාල සංඥා නාම දෙක වන්නේ

(i) තිත් -...............................................   (ii). තෙයි - ...........................................

48. තුන්සුළු දෙමහ පස්තිතට අයත් නර්තන අංග දෙකක් වන්නේ,

(i) ...........................................................   (ii). ...........................................................

49. 'නාට්‍ය ශාස්ත්‍රය' හා 'අභිනය දර්පනය' යන ග්‍රන්ථ දෙක රචනා කරන ලද්දේ පිළිවෙලින්,

(i) ...........................................................   (ii). ...........................................................

50. රුක්මණීදේවී අරුණ්ඩේල් හා මහාචාර්ය ජිනදාස වික්‍රමසිංහ යන අය පුරෝගාමී වූ නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

(i) රුක්මණීදේවී අරුණ්ඩේල් - .....................................................................

(ii). මහාචාර්ය ජිනදාස වික්‍රමසිංහ - .....................................................................

ශ්‍රේණිය 12

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- (52) නර්තනය II

පාසලේ නම : ..................................................

ඇතුළත්වීමේ අංකය : ..........................

කාලය : පැය 03 යි

- මෙම ප්‍රශ්න පත්‍රයේ **I, II හා III** වශයෙන් කොටස් **03 කින්** සමන්විත වේ.
- **I** කොටසේ **1 හා 2** ප්‍රශ්න **අනිවාර්යය** වේ.
- **II** හා **III** කොටස් වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුලුව ප්‍රශ්න **05 කට** පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයකට ම **(i)** කොටසට ලකුණු 06 ක් ද **(ii)** කොටසට ලකුණු 06 ක් ද **(iii)** කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. (i) පහත සඳහන් බෙර පදය ප්‍රස්ථාර කරන්න.
   'තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං ගත් තත් ජිං තරිකිට'
   (ii) පහත සඳහන් කවි පදය ඔබ උගත් තාල රූපයට අනුව ප්‍රස්ථාර කර දක්වන්න.
   'අනේ මී මැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ
   රුං රුං ගාමින් ඉගිලෙන ගුම් ගුම් නදයෙන් පැණි බොන'
   (iii) මුසලඩි වන්නමේ අඩව්ව මැදුම් මහ දෙතිතට ප්‍රස්ථාර කර දක්වන්න.

**2. දේශීය නර්තන ඉතිහාසය පිළිබඳ තොරතුරු අධ්‍යනයේ දී ලිඛිත පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වැදගත් වේ.**
   (i) ශ්‍රී ලංකාවේ වෘත්තීය නර්තන කලාවක් පැවති බවට තහවුරු කෙරෙන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (ii) පොළොන්නරු යුගයේ නර්තන කලාව කෙරෙහි භාරතීය අභාශය ලැබී ඇති බව සාධක දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.
   (iii) 'නර්තන කලාවේ ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කිරීමේ දී දේශාටන වාර්තා ද වැදගත් වේ.' නිදසුන් තුනක් ඇසුරෙන් විමසන්න.

## II කොටස

**3. ශාන්තිකර්ම ශිල්පියා සමාජ යහපැවැත්ම වෙනුවෙන් කටයුතු කරන්නෙකු මෙන්ම විවිධ අනුෂාංගික නිර්මාණ හැකියාවන්ගෙන් ද පෝෂණය වූ අයෙකි.**
   (i) රටයකුම ශාන්ති කර්මයේ වීදි සැරසිලි දෙකක් නම් කර එකක් විස්තර කරන්න.
   (ii) කිරි මඩුව ශාන්තිකර්මය හා බැඳි සමාජ සාරධර්ම දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.
   (iii) බලි ශාන්තිකර්ම ශිල්පියා විවිධ දක්ෂතාවන්ගෙන් පෝෂණය වූවෙකි. කරුණු 04 ක් ඇසුරෙන් විමසන්න.

**4. දේශීය ශාන්තිකර්ම විවිධ ඇදහිලි විශ්වාස මෙන්න චාරිත්‍ර විධි වලින් ද සමන්විත වන අතර ඒ ඒ නර්තන සම්ප්‍රදායන්ට ආවේණික ලක්ෂණ වලින් ද විද්‍යමාන වේ.**

(i) 'වලියක් මංගල්‍යය' හා බැඳුනු චාරිත්‍ර විධි දෙකක් නම් කර එක් චාරිත්‍රයක් විස්තර කරන්න.

(ii) රටයකුම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර එහි 'නානුමුර' පෙළපාලි අංගය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) බලි ශාන්තිකර්මයෙහි දක්නට ලැබෙන ඇඹුම් ශිල්පක්‍රම, වර්ණ ගැන්වීම්, සැරසිලි හා අමුද්‍රව්‍ය වල සුවිශේෂත්වය පිළිබඳ විග්‍රහයක් කරන්න.

5. (i) සාම්ප්‍රදායික කවි හා ජන කවි වල සමානතා අසමානතා පෙන්වා දෙන්න.

(ii) ගැමි නැටුම් වලට අදාල ගායනා දෙකක් මගින් ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ පැහැදිලි කරන්න.

(iii) ''ගැමි නැටුම් හා ගැමි ගායනා මගින් හෙළිවන්නේ ඔවුන්ගේ අව්‍යාජත්වයයි'' ගැමි නැටුම් දෙකක් නිදසුන් ලෙස ගෙන ඉහත පාඨය සනාථ කරන්න.

## III කොටස

**6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ), (ඉ) යන කොටස් වලට අදාලව අසා ඇති ප්‍රශ්න වලට වෙන වෙනම පිළිතුරු සපයන්න.**

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| තෝඩායම් | පටාචාරා | මෘදංගය |
| වර්ණම් | නට්ක්‍රැකර් | පුං |
| ඨුම්රි | නිදි කුමරිය | පඛ්වාජ් |
| රාස්ලීලා | බැරිසිල් | චෙන්ඩා |

(i) (අ) කොටස - ඊශාන දිග භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංගය පිළිබඳ විස්තර කරන්න.

(ii) (ආ) කොටස - ඔබ කැමති දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන එහි කථා පුවත, සංගීත නිර්මාණය, රංග වින්‍යාසය පිළිබඳ විමසීමක් කරන්න.

(iii) (ඉ) කොටස - භාරතීය නර්තන සම්ප්‍රදායන් අතරින් ආහාර්ය අභිනයට ප්‍රධාන තැනක් දෙන නර්තන සම්ප්‍රදායට අයත් වාදන භාණ්ඩය නම් කර ඒ පිළිබඳ විස්තරයක් කරන්න.

**7. 'නූතන ප්‍රාසාංගික නර්තනයට පෙරදිග මෙන්ම අපරදිග ආභාෂය ද ලබා ඇති බැව් රූපවාහිනී නර්තන වැඩ සටහන් නැරඹීමෙන් පැහැදිලි වේ.**

(i) නර්තන සංචලන කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ii) ප්‍රාසාංගික නර්තන නිර්මාණය සඳහා නූතන තාක්ෂණික ශිල්පක්‍රම යොදාගෙන ඇති ආකාරය පරීක්ෂා කරන්න.

(iii) රූපවාහිනි ළමා වැඩසටහන් මගින් ළමයින්ගේ කුසලතා වර්ධනයට පිටිවහලක් ලැබේ ද ? ඇගයීමක් කරන්න.

8. (i) චිත්‍ර කලාවේ මූලිකාංග නර්තන කලාව හා බැඳෙන ආකාරය උදාහරණ සහිතව දක්වන්න.

(ii) චරිතාංග අංගරචනය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

(iii) ''සාම්ප්‍රදායික නර්තනය සංරක්ෂණය සඳහා රූපවාහිනි මාධ්‍ය ඉවහල් වී ඇත.'' විචාරයට ලක් කරන්න.

LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**